www.agaram.lk

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 11 S |
|---|---|---|

**බුද්ධ ධර්මය** — කාලය පැය දෙකයි

නම / විභාග අංකය :

**සැලකිය යුතුයි :- ● සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01) සිදුහත් බෝසතාණන් වහන්සේට මනුලොව ඉපදීමට ආරාධනා කරන ලද්දේ,
i) සටීකාර බමුණා ය. ii) සහම්පති මහා බ්‍රහ්මයා ය.
iii) අසිත තවුසා ය. iv) සුද්ධෝදන රජතුමා ය.

02) පංච මහා විලෝකනයට අයත් නොවන්නේ,
i) කාලය. ii) දීපය . iii) මව. iv) පියා.

03) සිදුහත් කුමරුට නම් තැබීමේ උළෙල පැවැත්වූයේ කුමරු ඉපදී ,
i) දෙවන දිනයේ දී ය. ii) තුන් වන දිනයේ දී ය.
iii) හතරවන දිනයේ දී ය. iv) පස් වන දිනයේ දී ය.

04) බුදු දහමට අනුව මෙත් වැඩීමේ ආනිසංස ,
i) 11 කි. ii) 12 කි. iii) 13 කි. iv) 14 කි.

05) අත්ථස්සද්වාර ජාතකයේ දියුණුවීම සඳහා ඇති කරුණු හයෙහි " අලීනතා " යනු,
i) නිරෝගි බවයි. ii) දැහැමිව ජීවත් වීමයි.
iii) කම්මැලි නැතිකමයි iv) වැඩිහිටියන්ගේ උපදෙස් ලැබීමයි.

06) සීලය යනු,
i) කය හා වචනයේ සංවර බවයි. ii) සිත, කය හා වචනයේ සංවර බවයි.
iii) වචනයේ සංවර බවයි. iv) ති දොරේ සංවර බවයි.

07) ත්‍රී ශික්ෂාවට අයත් නොවන අංගය වන්නේ,
i) සීලය. ii) සමාධිය. iii) ප්‍රඥාව. iv) භාවනාව

08) " කායේන සංවරෝ සාධු " යන පාඨයෙන් අර්ථවත් වන්නේ ,
i) කය සංවර කර ගැනීම යහපත්ය. ii) වචනය සංවර කර ගැනීම යහපත්ය.
iii) මනස සංවර කර ගැනීම යහපත්ය. iv) තිදොර සංවර කර ගැනීම යහපත්ය.

09) සිගාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන් නම් කර ඇති දිශාව වන්නේ,
i) දකුණු දිශාවටයි. ii) උතුරු දිශාවටයි. iii) නැගෙනහිර දිශාවටයි. iv) බටහිර දිශාවටයි.

10) සමාජයේ යුතුකම් පිළිබඳ ඇතුළත් සූත්‍ර දේශනාව වන්නේ,
i) මහා මංගල සූත්‍රයයි. ii) සිගාලෝවාද සූත්‍රයයි.
iii) රතන සූත්‍රයයි. iv) දම්සක් පැවතුම් සූත්‍රයයි.

**⋆ ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට සපයා ඇති පිළිතුර අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

11) මඝ මානවක ඇතුළු පිරිස ආරක්ෂා කළේ ........................................ ප්‍රතිපදාවයි.

12) බුදුරජාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ට .................................... සූත්‍රය දේශනා කළහ.

13) ලොව ඇති සියල්ල සෑම මොහොතක වෙනස් වන බව පැහැදිලි කරන බෞද්ධ
ඉගැන්වීම ........................................................ ලෙස හඳුන්වනු ලබයි.

14) මිහිඳු මහ රහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජුට මුලින්ම දේශනා කළේ .................................... සූත්‍රයයි.

15) ශ්‍රී ලංකාවේ පැවිදි වූ මුල්ම කාන්තාව වූයේ ............................................ බිසවයි.

( අනුලා, චුල්ලහත්ථි පදෝපම සූත්‍රය, පංචශීල, අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය, ඛේමා, අටසිල්, )



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

★ ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න වලට හරි නම් ( ✓ ) ලකුණ ද , වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

16) ලක්දිවට බුදු දහම ලැබීමෙන් අනතුරුව ඉදි වූ ප්‍රථම ස්තූපය වන්නේ රුවන්වැලි සෑයයි. (...........)

17) මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු පිරිස ලක්දිවට වැඩම කරන ලද්දේ පොසොන් පොහොය දිනකය. (...........)

18) සංඝමිත්තා තෙරණිය සමඟ ශිල්ප ශ්‍රේණි 18 ක පිරිසක් ලංකාවට පැමිණියහ. (...........)

19) දැඩි ලෝභය නිසා විනාශයට මෙන්ම පිරිහීමට ද හේතු වන බව කියැවෙන ජාතක කතාවක් ලෙස අත්ථස්සද්වාර ජාතකය ගත හැක. (...........)

20) ශ්‍රද්ධාව යනු තෙරුවන් කෙරෙහි ඇති වන පැහැදීමයි. (...........)

## II කොටස

★ පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න

01) I - X දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

I) ජාතික කොඩියේ අඩංගු පහත සඳහන් සංකේත වලින් අර්ථවත් වන්නේ කුමක්ද?
i. බෝපත් සතර -
ii. කහ තීරුව -

II) ජාතික කොඩිය පරිහරණයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න.

III) අපගේ ජාතික ගීය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

IV) ජාතික ගීය ගායනා කිරීමේ දී සැලකිළිමත් විය යුතු කරුණු 02 ක් ලියන්න.

V) පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.

VI) පරිසරය දූෂණය වන ආකාර 02 ක් ලියන්න.

VII) පාසල් පරිසරය පිරිසිදුව තබා ගැනීමට ඔබට කළ හැකි දේවල් 02 ක් ලියන්න.

VIII) පරිසරය දූෂණය වීමෙන් ඇති විය හැකි ගැටලු 02 ක් ලියන්න.

IX) පරිසරය සුරකීමේ අගය පෙන්වා දෙන පංති කාමරයේ ප්‍රදර්ශනය කළ හැකි ආදර්ශ පාඨ 02 ක් ලියන්න.

X) පරිසරය සුරකීම සඳහා මිතුරන් සමඟ එකතු වී ඔබට කළ හැකි ක්‍රියාකාරකම් 02 ක් ලියන්න.
( 2 x 10 = 20)

02) I) බුදු දහමට අනුව ශීලය යනු කුමක් ද?
II) ශීලයේ කයින් සිදු වන වැරදි 03 ක් ලියන්න.
III) පාසල් ශිෂ්‍යයකු වශයෙන් ඔබට ශීලයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න ( 2 + 3 + 5 = 10 )

03) I) සිගාලෝවාද සූත්‍රයට අනුව බුදුරජාණන් වහන්සේ මවුපියන් සමාන කර ඇත්තේ කුමන දිශාවට ද?
II) දරුවන් විසින් දෙමාපියන්ට ඉටු කළ යුතු යුතුකම් 03 ක් ලියන්න.
III) දෙමාපියන්ගෙන් දරුවන්ට සැලසෙන යහපත පැහැදිලි කරන්න. ( 2 + 3 + 5 = 10 )

04) I) බුදුරජාණන් වහන්සේ විසින් රාහුල හාමුදුරුවන්ට දේශනා කළ සූත්‍රය කුමක් ද?
II) බුදුරජාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ට දේශනා කළ පරිදි හොඳ ක්‍රියාවක් ( කුසල කර්මයක් ) හඳුනා ගන්නා මිනුම් දඬු මොනවා ද?
III) මෙම මිනුම් දඬු අනුව ඔබට සිදු කළ හැකි යහපත් ක්‍රියා පහක් ලියන්න. ( 2 + 3 + 5 = 10 )

05) I) "සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ" යන ගාථාව සම්පූර්ණ කරන්න.
II) ඉහත ගාථාවේ තේරුම ලියන්න.
III) බුදු දහමේ ඉගැන්වෙන ''අත්තූපනායික ධර්ම පරියාය'' නම් ඉගැන්වීම ශිෂ්‍යයකු ලෙස ඔබට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. ( 2 + 3 + 5 = 10 )

06) I) බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රද්ධාව යනු කුමක්ද?
II) ශ්‍රද්ධාව ප්‍රධාන වශයෙන් දෙයාකාරය. එය නම් කරන්න.
III) බෞද්ධයකු වශයෙන් අප තුළ පැවතිය යුත්තේ කුමන ශ්‍රද්ධාව ද? ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. ( 2 + 3 + 5 = 10 )

07) පහත සඳහන් මාතෘකා අතරින් 02 ට කෙටි සටහන් ලියන්න.
I) මහින්දාගමනයෙන් අප ලත් දායාද. II) අරපිරිමැස්ම
III) පරිසරය සුරකිමු. IV) පන්සිල්.
V) දියුණුවේ රන් දොරටු ( 5+ 5 = 10 )



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk